**රුහුණ විශ්වවිද්‍යාලය**

**2017/2018 අධ්‍යයන වර්ෂය**

**ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පළමු සමාසික අවසාන පරීක්ෂණය**

**2018 දෙසැම්බර්**

# MAE 5100 - සූක්ෂ්ම ආර්ථික න්‍යාය

ප්‍රශ්න <u>හතරකට (04)</u> කට පමණක් පිළිතුරු සපයන්න.

ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත.

**කාලය: පැය 03 යි.**

---

01. ආ) i නිෂ්පාදන කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව අතර වෙනස පෙන්වා දෙන්න.

ii. වෙළෙඳ පොළ අර්ථ ක්‍රමයක මිලෙහි කාර්යයන් කවරේ ද?

(ලකුණු 05 යි)

ආ) "සාර්ථක සලාක කිරීමේ ක්‍රමයකින් තොරව භාණ්ඩයක් සඳහා මිල පාලන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම තුළින් එම භාණ්ඩය සඳහා කළු කඩයක් නිර්මාණය වීමට ඉඩ ඇත." පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි)

ඇ) එක්තරා භාණ්ඩයක් සඳහා පවතින සැපයුම් ශ්‍රිතය $Qs = 500 + 20\,P$ වේ. මෙම භාණ්ඩයේ මිල රු.20/= දී ඒකක 400ක් ඉල්ලුම් කරනු ලැබේ. ඉල්ලුම් සමීකරණය රේඛීය එකක් වන අතර වෙළෙඳ පොළ සමතුලිත මිල රු.10/= කි.

i. මෙම භාණ්ඩය සඳහා ඉල්ලුම් සමීකරණය ලබාගන්න.

ii. මෙම භාණ්ඩය සඳහා රජය රු.15/= ක සහතික මිලක් නිෂ්පාදකයන්ට හඳුන්වා දුන්නේ යැයි සිතන්න. මෙම මිල ආධාරක ප්‍රතිපත්ති සඳහා රජයට දැරීමට සිදුවන මුළු පිරිවැය කොපමණ ද?

(ලකුණු 06 යි)

02. අ) සුදුසු රූපසටහන් හා උදාහරණ භාවිතා කරමින් පහත සඳහන් ප්‍රකාශ පැහැදිලි කරන්න.

i. "භාණ්ඩයක් මත පනවනු ලබන විකුණුම් බද්දක්, අවශ්‍යයෙන්ම බද්දේ මුළු ප්‍රමාණයෙන්ම මිල ඉහළ නොදමයි."

(ලකුණු 05 යි)

ii. "භාණ්ඩයක ඉල්ලුම වැඩි වීමකදී හා සැපයුම අඩු වීමකදී සමතුලිත මිල ඉහළ යාම නිශ්චිත නමුත් සමතුලිත ප්‍රමාණය අඩුවනවා ද වැඩිවනවා ද යන්න තීරණය වනුයේ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර විතැන් වීමේ සාපේක්ෂ ප්‍රමාණය මතයි."

(ලකුණු 05 යි)

ආ) "මකුළු දැල් න්‍යාය" විස්තර කරන්න. කවර පදනම් මත පිහිටා මකුළු දැල් න්‍යාය ඔබ විවේචනය කරන්නේ ද?

(ලකුණු 05 යි)

03\. අ) කිසියම් පුද්ගලයකු තම මුළු ආදායම X හා Y භාණ්ඩ මත වැය කිරීමෙන් උපයෝගීතාව උපරිම කරන්නේ යැයි සිතමු. එක් භාණ්ඩයක ආන්තික උපයෝගීතාව අනෙක් භාණ්ඩයේ පරිභෝජන ප්‍රමාණයෙන් ස්වාධීන වේ.

| Q | MUx | MUy |
|---|---|---|
| 1 | 40 | 100 |
| 2 | 35 | 85 |
| 3 | 30 | 60 |
| 4 | 25 | 50 |
| 5 | 20 | 48 |
| 6 | 15 | 45 |
| 7 | 10 | 40 |

i. පාරිභෝගිකයාගේ ආදායම රු.24/= ක් වේ. උපයෝගීතාව උපරිම කරන අවස්ථාවේදී මිල රු.2/=ක් වන X භාණ්ඩයෙන් ඒකක හතරක් මිලදී ගනී. එම අවස්ථාවේදී ඔහු විසින් මිලදී ගනු ලබන Y භාණ්ඩයේ ආන්තික උපයෝගීතාව 50 ක් නම් Y හි මිල ගණනය කරන්න.

ii. අනෙකුත් දෑ නොවෙනස්ව පවතිද්දී ඔහුගේ ආදායම රු.38/= දක්වා වැඩි වුණි නම් මුළු උපයෝගීතාව උපරිම කරන භාණ්ඩ සංයෝගය කවරේ ද?

(ලකුණු 05 යි)

ආ) උපේක්ෂා වක්‍ර සිතියමක් ඇසුරින් පහත ප්‍රකාශය පැහැදිලි කරන්න. "බාල භාණ්ඩයක් යනු සෘණ ආදායම් ප්‍රතිවිපාකයක් සහිත භාණ්ඩයකි. එහෙත් ඇතැම් බාල භාණ්ඩ සම්බන්ධයෙන් සෘණ ආදායම් ප්‍රතිවිපාකය, මිල වෙනසක ආදේශන ප්‍රතිවිපාකය අභිබවා යෑමට තරම් විශාල වේ."

(ලකුණු 05 යි)

ඇ) ශ්‍රමිකයන්ගෙන් වැඩිපුර හෝ අතිකාල වැඩ ලබා ගැනීම සඳහා සාමාන්‍ය වැටුප් අනුපාතිකයට වඩා වැඩි වැටුප් අනුපාතිකයක් ගෙවීමට අවශ්‍ය වන්නේ ඇයි? ඔබේ පිළිතුර උපේක්ෂා වක්‍ර විශ්ලේෂණය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

04\. අ) "කෙටිකාලීන හා දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍ර U අක්ෂරයේ හැඩය ගැනීමට පදනම වනුයේ හීනවන ආන්තික ඵලදා නීතියයි." මෙම ප්‍රකාශයෙහි සත්‍ය/අසත්‍යතාව ප්‍රකාශ කර ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ) සම නිෂ්පාදන වක්‍ර අදාල කරගනිමින් වැඩිවන පරිමාණානුකූල ඵල, අඩුවන පරිමාණානුකූල ඵල හා ස්ථාවර පරිමාණානුකූල ඵල පෙන්වා දෙන්න.

(ලකුණු 05 යි)

ඇ) එක්තරා ආයතනයක් සඳහා ඇස්තමේන්තු කරන ලද නිෂ්පාදන ශ්‍රිතය පහත දැක්වේ.

$$Q = 10K^{0.7}L^{0.1}$$

මෙහි Q = නිෂ්පාදන ප්‍රමාණය, K = ප්‍රාග්ධන යෙදවුම් ප්‍රමාණය, L = ශ්‍රම යෙදවුම් ප්‍රමාණය වේ.

නිෂ්පාදකයා මෙම නිෂ්පාදක සඳහා රු.4000/= ක් වැය කරන අතර මෙහි ප්‍රාග්ධන ඒකකයක මිල රු.28/=ක් හා ශ්‍රම ඒකකයක මිල රු.10/= කි.

නිෂ්පාදනය උපරිම කරන අවස්ථාවේදී යොදා ගන්නා ප්‍රශස්ත සාධක සංයෝගය (ප්‍රාග්ධන ශ්‍රම සංයෝගය) ගණනය කරන්න.

(ලකුණු 05 යි)

05. අ) "පූර්ණ තරඟකාරී ආයතනයක් මිල ගන්නකු වන නමුත් ඒකාධිකාරයා මිල තනන්නෙකි." පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි)

ආ) "සම්පත් බෙදා හැරීම හා නිෂ්පාදනය කුමන අර්ථයෙන් වුවද ඒකාධිකාරයට වඩා පූර්ණ තරඟය යටතේ කාර්යක්ෂම වේ." පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ඇ) ඒකාධිකාරයකුට එකිනෙකට වෙනස් වෙළෙඳ පොළවල් දෙකක භාණ්ඩ අළෙවි කළ හැකි යැයි සිතන්න.

පළමු වෙළෙඳ පොළේ ඉල්ලුම් ශ්‍රිතය $P_1 = 10 - Q_1$

දෙවන වෙළෙඳ පොළේ ඉල්ලුම ශ්‍රිතය $P_2 = 20 - Q_2$

මෙම ඒකාධිකාරයාගේ ආන්තික පිරිවැය ස්ථාවර වේ. සියලුම අදාල නිමවුම් මට්ටම්වලදී එය රු.2/=කි.

i. වෙළෙඳ පොළවල් අතර මිල විශේෂණය කිරීමේදී ලාභ උපරිම කිරීම සඳහා කවර මිලක් නිෂ්පාදකයා අය කරයි ද?

ii. මිල විශේෂණය කරන විට හා මිල විශේෂණය නොකරන විට ඒකාධිකාරයාගේ ලාභය සංසන්දනය කරන්න.

(ලකුණු 06 යි)

06. අ) "නැමුණු ඉල්ලුම් වක්‍ර විග්‍රහය මිල දැඩියාව විස්තර කරයි." පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ) කතිපයාධිකාරය පිළිබඳ කුනෝට්ගේ විග්‍රහය හා චෙම්බර්ලින්ගේ විග්‍රහය අතර වෙනස්කම් විස්තර කරන්න.

(ලකුණු 05 යි)

ඇ) “ එකතුව ශුන්‍ය ක්‍රීඩාව යන්න කෙටියෙන් පැහැදිලි කර පහත සඳහන් A ගේ ගෙවුම් න්‍යාස ඇසුරින් වෙළෙඳ පොළ කොටස අත්කර ගැනීමේදී A හා B තෝරාගන්නා ප්‍රශස් ක්‍රමෝපාය තීරණය කරන්න.

| | $B_1$ | $B_2$ | $B_3$ |
|---|---|---|---|
| $A_1$ | 30 | 80 | 10 |
| $A_2$ | 40 | 20 | 90 |
| $A_3$ | 50 | 60 | 70 |

(ලකුණු 05 යි

07. අ) සාධක වෙළෙඳ පොළක දී පූර්ණ තරඟකාරයකුගේ සාධක සැපයුම් වක්‍රය තිරස් රේඛාවක් හා ක්‍රයේකාධිකාරයකුගේ සාධක සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන රේඛාවක් වන්නේ ඇයි

(ලකුණු 02 යි)

ආ) සාධකයක “ඒකාධිකාරී සූරාකෑම” සහ “ක්‍රයේකාධිකාරී සූරාකෑම” අතර වෙනස වෙන්කොට හඳුනාගන්න.

(ලකුණු 04 යි)

ඇ) ප්‍රස්තාර සටහන් උපයෝගී කරගනිමින් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් වැටුප් අනුපාතය හා සේවා නියුක්තිය යන දෙකම ඉහළ දාගත හැකි අවස්ථාවක් විස්තර කරන්න.

(ලකුණු 04 යි)

ඈ) ආර්ථික බදු කුලිය හා ආන්තර බදු කුලිය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

08. අ) i. ධන බාහිරතා ජනනය කරන පාරිභෝගික භාණ්ඩයක නිදහස් වෙළෙඳ පොළ සමතුලිත නිමැවුම් මට්ටම සහ සමාජීය වශයෙන් කාර්යක්ෂම නිමැවුම් මට්ටම අතර වෙනස සුදුසු රූප සටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

iii. “ධන බාහිරතා ජනනය කරන පාරිභෝගික භාණ්ඩයක් මගින් ඇති කරන වෙළෙඳ පොළ අකාර්යක්ෂමතාව පාරිභෝගිකයන්ට සහනාධාරයක් සැපයීමෙන් රජයට නිවැරදි කළ හැකි වේ.” ප්‍රස්තාර සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

ආ) i. “පැරටෝ ප්‍රශස්තය” යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

ii. “පොදු සමතුලිතය අත්කර ගැනීමේදී $MRT_{xy} = MRS^{A}_{xy} = MRS^{B}_{xy}$ කොන්දේසිය ඉටුවිය යුතුය.” සුදුසු ප්‍රස්තාර සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 09 යි)

@@@@@@@@@